Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## බුද්ධ ධර්මය

**නම/විභාග අංකය :-** ................................................................................. **කාලය : පැය 02 යි.**

**සැලකිය යුතුයි:**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

### I කොටස

1. බුදුරජාණන් වහන්සේ පස්වන සතිය ගතකළ ස්ථානය නම්,
   1. මිදෙල්ල ගස මුල
   2. අජපාල නුගරුක මුල
   3. කිරිපලු නුගරුක මුල
   4. ජය ශ්‍රී මහා බෝධි මූලයෙහිය

2. බුදුන් දහම් සරණ ගිය ප්‍රථම දේවාචික උපාසකවරු වන්නේ,
   1. නදී හා ගයා කාශ්‍යප ය
   2. කෝලිත හා උපතිස්ස ය
   3. තපස්සු හා භල්ලුක ය
   4. ආලාර කාලාම හා උද්දකරාමපුත්ත ය

3. විමල, සුබාහු, පුණ්ණජි, ගවම්පතී යන සතර දෙනා,
   1. යසකුල පුතුගේ මිතුරන් ය
   2. නදී කාශ්‍යපගේ මිතුරන් ය
   3. උරුවෙල් කාශ්‍යපගේ මිතුරන් ය
   4. ගයා කාශ්‍යපගේ මිතුරන් ය

4. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ඕවාද ප්‍රාතිමෝක්ෂය දේශනාකරන ලද්දේ,
   1. බුද්ධත්වයෙන් වසර දෙකකට පසුය
   2. බුද්ධත්වයෙන් වසරකට පසුය
   3. බුද්ධත්වයෙන් සිව් වසරකට පසුය
   4. බුද්ධත්වයෙන් මාස තුනකට පසුය

5. බුදුරජාණන් වහන්සේ සතුවූ දමනය කළ නොහැකි සියල්ලන් දමනය කිරීමේ හැකියාව ධර්මයේ දැක්වෙන්නේ,
   1. විජ්ජාචරණ සම්පන්න ගුණය ලෙසය
   2. අනුත්තරෝ පුරිසදම්ම සාරථී ගුණය ලෙසය
   3. සම්මා සම්බුද්ධ ගුණය ලෙසය
   4. ලෝකවිදූ ගුණය ලෙසය

6. තුන් සූත්‍රයට අයත් සූත්‍ර දේශනාවන් වන්නේ,
   1. මහා මංගල සූත්‍රය, සිගාලෝවාද සූත්‍රය, රතන සූත්‍රය
   2. රතන සූත්‍රය, කරණීයමෙත්ත සූත්‍රය, අණන සූත්‍රය
   3. මහා මංගල සූත්‍රය, රතන සූත්‍රය, කරණීය මෙත්ත සූත්‍රය
   4. මහා මංගල සූත්‍රය, රතන සූත්‍රය, දම්සක් පැවතුම් සූත්‍රය

7. කරණීය මෙත්ත සූත්‍රයේ මෙත් වැඩිය යුතු සියලු සතුන් අතර, 'ථාවරා' යනුවෙන් සඳහන් සතුන් වන්නේ,
   1. තැති නොගන්නා සත්ත්වයෝ ය
   2. තැති ගන්නා සුළු සත්ත්වයෝ ය
   3. ඇසට පෙනෙන සත්ත්වයෝ ය
   4. ඇසට නොපෙනෙන සත්ත්වයෝ ය

8. බුදු සසුනේ අග්‍ර දායකයා හා දායිකාව බවට පත්වූයේ,
   1. කොසොල් රජතුමා හා බන්දුල මල්ලිකාව ය
   2. කොසොල් රජතුමා හා කෝසල මල්ලිකාව ය
   3. අනේපිඬු සිටුතුමා හා විශාඛාව ය
   4. පූර්ණවර්ධන සිටුතුමා හා විශාඛාව ය

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

9. ආනන්ද හිමිගේ මග පෙන්වීම අනුව ආනන්ද බෝධිය රෝපණය කර ඇත්තේ,
1. ජේතවනාරාමයේ ය 2. වාලුකාරාමයේ ය 3. නීග්‍රෝධාරාමයේ ය 4. අශෝකාරාමයේ ය

10. බුදු දහම පටිසෝතගාමී ධර්මයක් වේ. එහි තේරුම වන්නේ බුදු දහම,
1. උඩුගං බලා යාමට මග පෙන්වන දහමක් බව ය 2. යටිගං බලා යාමට මග පෙන්වන දහමක් බව ය
3. ඉදිරියට බලා යාමට මග පෙන්වන දහමක් බව ය 4. දකුණත බලා යාමට මග පෙන්වන දහමක් බව ය

11. නිත්‍ය ශීලය, ගෘහස්ථ ශීලය යන නම් වලින් හැඳින්වෙන්නේ,
1. පංච ශීලයයි 2. දස සීලයයි 3. අෂ්ටාංග ශීලයයි 4. කෝටියක් සංවර ශීලයයි

12. පංච ශීලයෙහි ඇති ආජීව අෂ්ටමක ශීලයට අයත් නොවන සිල් පදය වන්නේ,
1. පිසුනාවාචා වේරමණී සික්ඛාපදං සමාධියාමි
2. ඵරුසාවාචා වේරමණී සික්ඛාපදං සමාධියාමි
3. සම්ඵප්පලාපා වේරමණී සික්ඛාපදං සමාධියාමි
4. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාධියාමි

13. මිච්ඡා ආජීවය යනුවෙන් ධර්මයෙහි සඳහන් වන්නේ,
1. නිවැරදි දිවි පැවැත්මයි 2. හිස් වචන කතා කිරීමයි 3. රළු වචන කතා කිරීමයි 4. වැරදි දිවි පැවැත්මයි

14. සිගාලෝවාද සූත්‍රයට අනුව අපට රැකවරණය සැලසීම,
1. ගුරුවරුන්ගෙන් ඉටුවන යුතුකමකි 2. දෙමාපියන්ගෙන් ඉටුවන යුතුකමකි
3. මිතුරන්ගෙන් ඉටුවන යුතුකමකි 4. වැඩිහිටියන්ගෙන් ඉටුවන යුතුකමකි

15. අපණ්ණක ජාතකයෙහි අනුවණ සාත්තු නායකයා වශයෙන් ඉපිද බුද්ධ කාලයේ දී විනාශ මුඛයට පැමිණියේ,
1. ඡන්න හිමියන්ය 2. දෙව්දත් හිමියන්ය 3. වක්කලී හිමියන්ය 4. සුභද්‍ර හිමියන්ය

16. සාලිකේදාර ජාතකයෙන් විස්තර වන්නේ,
1. අන්ධ දෙමාපියන්ට සැලකූ පුතෙකුගේ තොරතුරු වේ. 2. අන්ධ ස්වාමියාට සැලකූ බිරිඳකගේ තොරතුරු වේ.
3. දෙමාපියන්ට සැලකූ කුරුළු පැටවකුගේ තොරතුරු වේ. 4. වැඩිහිටියන්ට සැලකූ දරුවෙකුගේ තොරතුරු වේ.

17. කුඹුරුවලින් ලබාගන්නා අස්වැන්නේ පළමු කොටස ත්‍රිවිධ රත්නයට පූජා කිරීම හැඳින්වෙන්නේ,
1. සාංඝික දානය නමිනි 2. පේරු දානය නමිනි 3. අග්‍ර ශෂ්‍ය දානය නමිනි 4. දේව දානය නමිනි

18. සිගාලෝවාද සූත්‍රයේ ගුරුවරුන් උපමා කර ඇති දිශාව වන්නේ,
1. උතුරු දිසාවය 2. බටහිර දිසාවය 3. දකුණු දිසාවය 4. උඩ දිසාවය

19. සිරිත් මල්දම නම් ග්‍රන්ථය රචනා කරන ලද්දේ,
1. ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම්තුමා විසිනි 2. තොටගමුවේ රාහුල හිමිපාණන් විසිනි
3. වීදාගම මෛත්‍රීය හිමියන් විසිනි 4. පණ්ඩිත පරාක්‍රමබාහු රජතුමා විසිනි

20. පත්ත කම්ම සූත්‍රයේ පංච බලි තුළින් පෙන්වා දෙන්නේ,
1. උපයන ධනය තමාගේ යහපතට පමණක් යොදවාගත යුතු බවය
2. උපයන ධනය පවුලේ යහපතට පමණක් යොදවාගත යුතු බවය
3. උපයන ධනය මතු ප්‍රයෝජනය සඳහා රැකගත යුතු බවය
4. උපයන ධනය සමාජ යහපතට හේතුවන අයුරින් යොදවාගත යුතු බවය (ලකුණු 2 x 20 = 40)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## II කොටස

- **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

1. i. බුදු රජාණන් වහන්සේ සත්වන සතිය ගතකළ ස්ථානය නම් කරන්න.
   ii. ලෝකයාට දහම් දෙසන ලෙස බුදු රජාණන් වහන්සේට ආරාධනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
   iii. තෙරුවන් සරණ ගිය පළමු උපාසිකාවන් දෙදෙනා නම් කරන්න.
   iv. බුදු රජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ තිරිසන් සතෙකු නම් කරන්න.
   v. තුන් පිටකය අතරින් ධම්ම පදය අයත්වන පිටකය කුමක්ද? (ලකුණු 4 x 5 = 20)

2. i. බුදු රජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ අසරණයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)
   ii. උපස්ථායකයෙකු තුළ තිබිය යුතු ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු 3)
   iii. ඔබ අසරණයෙකුට හෝ ගිලන් වූ පවුලේ කෙනෙකුට පිහිට වූ අවස්ථාවක් විස්තර කරන්න. (ලකුණු 5)

3. i. වෛරය සන්සිඳෙන අයුරු කියැවෙන ඔබේ පෙළපොතේ ඇතුලත් ධම්ම පද ගාථාව ලියන්න. (ලකුණු 2)
   ii. එම ධම්ම පද ගාථාවේ තේරුම ලියන්න. (ලකුණු 3)
   iii. මෛත්‍රී සහගතව කටයුතු කිරීමෙන් ඔබට සැළසෙන යහපත විස්තර කරන්න. (ලකුණු 5)

4. i. බොරු කීමෙන් වැළකීමේ ශික්ෂා පදය පාලියෙන් ලියන්න. (ලකුණු 2)
   ii. පංච ශීලයෙහි සමාදාන පක්ෂයට අයත් කරුණු තුන ලියන්න. (ලකුණු 3)
   iii. පන්සිල් රැකීමෙන් සමාජයට වන යහපත විස්තර කරන්න. (ලකුණු 5)

5. i. අඥාන වෙළඳ නායකයකු හා ඥානවන්ත වෙළඳ නායකයකු පිළිබඳ කියැවෙන ජාතක කතාවේ නම කුමක්ද? (ලකුණු 2)
   ii. එම කතා පුවත ඇසුරින් යහපත් නායකත්ව ගුණාංග 3 ක් ලියන්න. (ලකුණු 3)
   iii. ඥානවන්ත වෙළඳ නායකයා බුද්ධිමත්ව ක්‍රියා කිරීමෙන් තම අරමුණු ජයගත් ආකාරය විස්තර කරන්න. (ලකුණු 5)

6. i. විදේශීය වශයෙන් ඇති වූ ආක්‍රමණවලදී ඒවාට විසඳුම් සෙවීමට නායකත්වය ගෙන ක්‍රියා කළ භික්ෂූන් වහන්සේලා දෙනමකගේ නම් ලියන්න. (ලකුණු 2)
   ii. භික්ෂූන් වහන්සේලාගෙන් සමාජයට සිදුවන සේවාවන් 3 ක් ලියන්න. (ලකුණු 3)
   iii. කළගුණ සැලකීමේ අගය විස්තර වන වාක්‍ය 5 ක් ලියන්න. (ලකුණු 5)

7. පහත දැක්වෙන මාතෘකාවලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   i. විශාඛා මහ උපාසිකාව
   ii. ඉවසීම
   iii. ධම්ම පදය
   iv. වැඩිහිටියන්ට සැලකීම (එක් කොටසකට ලකුණු 5කි.)

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

Answer

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019

## 7 ශ්‍රේණිය
## බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය

**I කොටස**

| | | | |
|---|---|---|---|
| 1. - 2 | 6. - 3 | 11. - 1 | 16. - 3 |
| 2. - 3 | 7. - 1 | 12. - 4 | 17. - 3 |
| 3. - 1 | 8. - 3 | 13. - 4 | 18. - 3 |
| 4. - 2 | 9. - 1 | 14. - 1 | 19. - 1 |
| 5. - 2 | 10. - 1 | 15. - 2 | 20. - 4 |

**II කොටස**

1. i. කිරිපලු නුගරුක මුල/ රාජායතනය
   ii. සහම්පතී මහා බ්‍රහ්මයා
   iii. යසකුල පුතුගේ මව (සුජාතා) බිරිඳ
   iv. හඳුවතිකා ඇතින්න/ දරුවන් විසින් හිංසාවට ලක් කළ ගැරඩියා
   v. සූත්‍ර පිටකය

2. i. අසරණ වූ මහළු පියා, සුනීත, සෝපාක, පටාචාරා, කිසාගෝතමී, කුඹුරක සීසාමින් සිටි ගොවියා, පූතිගත්ත තිස්ස හිමි, රජ්ජුමාලා.... උචිත පිළිතුරු
   ii. රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙල කර දීම.
   රෝගියාට අවශ්‍ය හිතකර අහිතකර ආහාරපාන ගැන දැන ඒ අනුව කටයුතු කිරීම.
   ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් තොරව කරුණාවෙන් කටයුතු කිරීම.
   මල මූත්‍ර ආදිය කෙරෙහි පිළිකුල්බව නූපදවීම.
   රෝගියාගේ සිත සැනසෙන කතා පැවසීම.
   මින් තුනක් ඇතුළත් පිළිතුරක්.
   iii. අසරණයෙකුට පිහිට වූ අවස්ථාවක් හෝ පවුලේ අසනීප වූ කෙනෙකුට පිහිට වූ ආකාරය පිළිබඳ ලියා ඇති පිළිතුරකට ලකුණු දෙන්න. එහිදී කරුණාව පෙරදැරි කරගෙන කටයුතු කිරීම ලියා තිබිය යුතුය.

3. i. අක්කොච්ඡි මං අවධි මං
   අජිනි මං අහාසි මේ
   යේ තං න උපනය්හන්ති
   වේරං තේසූපසම්මති
   ii. අසවලා මට බැන්නේ ය. මට පහර දුන්නේ ය. මා පරාජය කළේ ය. මා සතු දෙය පැහැර ගත්තේ ය. යනුවෙන් යම් අය නැවත නැවත නොසිතත් නම්, ඔවුන්ගේ වෛරය සන්සිඳේ.
   iii. 7 ශ්‍රේණිය බුද්ධ ධර්මය පෙළ පොත 7 පාඩම ඇසුරින් ලියා ඇති සුදුසු පිළිතුරකට ලකුණු ලබාදෙන්න.

4. i. මුසාවාදා වේරමණී ශික්ඛාපදං සමාදියාමි.
   ii. තමා යහපතෙහි යෙදීම.
   අන් අය යහපතට යොමු කිරීම.
   යහපත් කටයුතු අනුමත කිරීම හා ඊට අනුබලදීම.
   iii. සියලු සත්වයින්ගේ ජීවත්වීමේ අයිතිය, දේපල පරිහරණය කිරීමේ හැකියාව, සදාචාර සම්පන්න ජීවිත ගතකිරීමේ හැකියාව, සත්‍යවාදීව ජීවත්වීමේ හැකියාව, කළ කෝලාහලයන්ගෙන් තොරව මනා සිහිබුද්ධියෙන් යුතුව, තමාටත්, සමාජයටත් යහපත්ව අවබෝධයෙන් ජීවත්වීමේ පසුබිම පන්සිල් වලින් තහවුරු වන බවට අදාළවන පිළිතුරක් සඳහා ලකුණු ලබාදෙන්න.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

**Answer**

5. i. අපණ්ණක ජාතකය

ii. සැලසුම්සහගත බව, සූදානම, දුර දක්නා නුවණ, තම පිරිස සමග නිරන්තර සංවාද තුළින් අරමුණු කරා යාම, පිරිස් කළමනාකරණය, විමසිලිමත් බව, නිවැරදි තීරණ ගැනීම, එඩිතර බව, සුහදශීලීබව ආදි ජාතක කතාවට අදාළවන නායකත්ව ලක්ෂණ තුනක් සඳහන් විය යුතුය.

iii. නිවැරදි නායකත්වය නිසා ඔවුන් අරමුණු ජයගත් ආකාරය විස්තර වන,

උපද්‍රවයකින් තොරව වෙළදාමෙහි යෙදීම.

ඉහළ මිලකට බඩු විකිණීමට හැකි වීම.

දුරදක්නා නුවණින් කටයුතු කිරීම නිසා අරමුණු ජයගත් ආකාරය විස්තර වන පිළිතුරකට ලකුණු ලබා දෙන්න.

6. i. වාරියපොල සුමංගල හිමි, කුඩාපොල හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි, හික්කඩුවේ සුමංගල හිමි, රත්මලානේ ධර්මාලෝක හිමි

ii. ජනතාවට ධර්ම දානයෙන් සංග්‍රහ කිරීම. උපතේ සිට මරණය දක්වා මිනිසාගේ සියලුම විශේෂ කටයුතු වලදී ආගමික, සමාජික කටයුතු ඉටුකරදීම.

උදා:- පිංකම් කටයුතු, දානමය කටයුතු, අවමංගල කටයුතු,

ගැටුම් ආරවුල් සංසිඳවීම ආදී වශයෙන් භික්ෂූන් වහන්සේලාගෙන් ජනතාවට සිදුවන සේවාවන් තුනක් ලිවීම ප්‍රමාණවත් වේ.

iii. බුදු රජාණන් වහන්සේ අනිමිස ලෝචන පූජාව තුළින් කළ ගුණ සැලකීමේ ගුණය ලොවට පෙන්නුම් කළ සේක.

මවට දහම් දෙසීමට තව්තිසා දෙව්ලොවට වැඩම කළහ.

බුද්ධ මාතාවට කළගුණ සැලකීමක් වශයෙන් දොරටුව තෙක් පසුපසින් ගමන්ගත සේක.

තමාගේ දෙමාපියන්ට, ගුරුවරුන්ට, උදව් කළ අයට, කළ ගුණ සැලකීමේ ගුණය අප තුළ ඇතිකර ගත යුතු බව දැක්වෙන වාක්‍ය 5 ක් ලිවිය යුතුය.

7. i. විශාඛා මහ උපාසිකාව

අංග ජනපදයේ භද්දිය නුවර ධනංජය සිටු තුමා හා සුමනා සිටු දේවියගේ දියණිය විශාඛාවයි. රූමත් බුද්ධිමත් වූ පංච කල්‍යාණියෙන් හෙබි ඇය හත් හැවිරිදි වයසේ දී සෝවාන් බවට පත්වූවාය.

සැණකෙළියක් අවස්ථාවේ දී කරන ලද ප්‍රශ්න කිරීම් වලින් ඇයගේ බුද්ධිමත් බව ප්‍රකාශ වන අතර පූර්ණවර්ධන කුමාරයා සමග විවාහ වූවාය. සැමියාගේ දෙමාපියන්ට නිවැරදි මග කියාදුන් හෙයින් මිගාර මාතා නමින් ප්‍රසිද්ධ වූවාය. එතුමිය බුදු සසුනේ අග්‍ර දායිකාව බවට පත්වූණි. පෙළපොතේ 50 පිටුවෙහි සඳහන් ආදර්ශ හෝ ඉහත කරුණු ඇතුලත් පිළිතුරකට ලකුණු ලබාදෙන්න.

ii. ඉවසීම

තමාට කවුරුන් හෝ ආක්‍රෝෂ පරිභව කරන කල්හි දුක් ගැහැට දෙන කල්හි ඔවුන් කෙරෙහි වෙනසකට නොපැමිණ නොකිපී විරුද්ධව ක්‍රියා නොකර සිටීනම් එය ඉවසීමේ ලක්ෂණය ලෙස බුදු දහමින් පැහැදිලි කරයි. බුද්ධ චරිතයෙන් හා පුණ්ණ හිමිගේ චරිතයෙන් ඉවසීම පිළිබඳ ආදර්ශ ලබාගත හැකි වේ. සැනසීම ලැබීම, නිරෝගී බව, ගුණ ධර්ම වර්ධනය කර ගැනීමට සතුරන් ජය ගැනීමට ඉවසීම හේතු වේ. (පෙළ පොත 12 පාඩම)

iii. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ධම්ම පදය බෞද්ධයන්ගේ අත් පොතයි. එහි ගාථා හාරසිය විසිතුනක් ඇති අතර ඒවා වග්ග විසිහයකට සංග්‍රහ කර ඇත. ජීවිතය සකස් කර ගැනීමට අවශ්‍ය උපදේශ සපයන ග්‍රන්ථයක් ලෙස ධම්ම පදය හැඳින්විය හැකි ය. (පෙළපොත 07 පාඩම)

iv. වැඩිහිටියන්ට සැලකීම

වයසින් වැඩිමහළු වූ පිරිස වැඩිහිටියන් ලෙස සලකන අතර දෙමාපියන්, ගුරුවරුන්, පූජ්‍ය උතුමන් වැඩිහිටියන් වන අතර, වයසින් බාල වුව ද ගුණයෙන් නුවණින් අපට වඩා උසස් අයද වැඩිහිටියන් ලෙස සැළකේ. දහමෙහි වෘද්ධාපචායනය ලෙස සඳහන් කර ඇත.

අප වැඩිහිටියන් රටේ සමාජයේ අභිවෘද්ධිය සඳහා කාලය, ධනය, ශ්‍රමය කැපකළ පිරිසයි. ඔවුන්ව රැකබලා ගැනීම හා අවශ්‍යතා ඉටුකිරීම අපගේ වගකීමයි. දරුවන් දෙමාපියන්ට අවශ්‍ය යුතුකම් ඉටුකරන්නේ නම් ඔවුන් වැඩිහිටි නිවාසවලට නොයයි. මහළු කළ ඔවුන් අසරණ බවට පත් නොවෙති.